**වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය**

# තේ පර්යේෂණ මණ්ඩලය

## ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

# ඇබෑර්තු

1. කනිෂ්ඨ සහකාර ලිපිකරු - ශාන්ත ජෝකිම් වත්ත, රත්නපුර.
2. කනිෂ්ඨ සහකාර කර්මාන්ත ශාලා නිලධාරී - ශාන්ත ජෝකිම් වත්ත, රත්නපුර.
3. ක්ෂේත්‍ර නිලධාරී - ශාන්ත ජෝකිම් වත්ත, රත්නපුර.
4. රියදුරු - ශාන්ත ජෝකිම් වත්ත, රත්නපුර.

රත්නපුර පිහිටි ශාන්ත ජෝකිම් වතුයායේ පුරප්පාඩුව ඇති පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. කනිෂ්ඨ සහකාර ලිපිකරු (Junior Assistant Clerk)

**රැකියා විස්තරය**

ප්‍රධාන ලිපිකරු / ජ්‍යෙෂ්ඨ සහකාර ලිපිකරුගේ අධීක්ෂණය යටතේ කොට්ඨාස (Divisional) කටයුතුවලට අදාළ කරුණු ඇතුළු කොට්ඨාස පිරික්සුම් (Divisional), පොත්පත් සහ ලේඛන හැසිරවීම සහ ගණනය කිරීම.

**අධ්‍යාපනික සුදුසුකම් සහ පළපුරුද්ද**

අ.පො.ස (සා.පෙළ) විභාගය ඉංග්‍රීසි සහ අංක ගණිතය / ගණිතය (වතු ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති අයට මෙය අදාළ නොවේ) සමඟ පුහුණු චෙක්රෝල් ලිපිකරුවෙක් ලෙස පළපුරුද්ද අත්‍යාවශ්‍යවේ.

**වැටුප** : වතු කාර්ය මණ්ඩල සාමූහික ගිවිසුමට අනුව සාකච්ඡා කළ හැක

**වයස් සීමාව** : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය (තේ පර්යේෂණ ආයතනයේ වතුයායන්වල සේවයේ යෙදී සිටින අය සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ).

## 2. කනිෂ්ඨ සහකාර කර්මාන්ත ශාලා නිලධාරී (Junior Assistant Factory Officer)

**රැකියා විස්තරය**

කර්මාන්තශාලා නිලධාරියාගේ / ජ්‍යෙෂ්ඨ සහකාර කර්මාන්තශාලා නිලධාරියාගේ අධීක්ෂණය යටතේ තේ සැකසීමේදී කර්මාන්තශාලා නිලධාරියාට සහය වීම.

**අධ්‍යාපනික සුදුසුකම් සහ පළපුරුද්ද**

අ.පො.ස (සා.පෙළ) විභාගය ඉංග්‍රීසි සහ අංක ගණිතය / ගණිතය (වතු ක්ෂේත්‍රයේ පළපුරුද්ද ඇති අයට මෙය අදාළ නොවේ) සමඟ පුහුණු කර්මාන්තශාලා අධීක්ෂක ලෙස පළපුරුද්ද අත්‍යාවශ්‍යවේ.

**වැටුප** : වතු කාර්ය මණ්ඩල සාමූහික ගිවිසුමට අනුව සාකච්ඡා කළ හැක

**වයස් සීමාව** : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය (තේ පර්යේෂණ ආයතනයේ වතුයායන්වල සේවයේ යෙදී සිටින අය සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ).

## 3. ක්ෂේත්‍ර නිලධාරී (Field Officer)

**රැකියා විස්තරය**

"අධිකාරිවරයාගේ උපදෙස් යටතේ අස්වනු නෙලීමේ කටයුතු, කෘෂිකාර්මික භාවිතයන් සිදු කිරීම, සියලු කොට්ඨාසයීය පොත්පත් පවත්වාගෙන යාම සහ කම්කරු ගැටලු හැසිරවීම සම්බන්ධයෙන් වගකීම දරයි"

**අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද**

ඉංග්‍රීසි සහ අංක ගණිතය / ගණිතය සමග අ.පො.ස (සා/ පෙළ) විභාගය (ක්ෂේත්‍රයේ පළපුරුද්ද සහිත අයදුම්කරුවන් සඳහා මෙය අදාළ නොවේ)

**සහ**

සහකාර ක්ෂේත්‍ර නිලධාරියෙකු ලෙස අවම අවුරුදු 05 ක පළපුරුද්ද.

**වැටුප** : වතු කාර්ය මණ්ඩල සාමූහික ගිවිසුමට අනුව සාකච්ඡා කළ හැක

**වයස් සීමාව** : අවුරුදු 32 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය (තේ පර්යේෂණ ආයතනයේ වතුයායන්වල සේවයේ යෙදී සිටින අය සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ).

## 4. රියදුරු (Driver)

**රැකියා විස්තරය**

වාහනය භාරව කටයුතු කිරීම සහ අමු දළු වර්ග සහ රෝගීන් ප්‍රවාහනය කිරීම, වාහනයේ ඇතිවන සුළු අලුත්වැඩියාවන් සහ දිනපතා නඩත්තු කිරීම සහ දිනපතා වාර්තා (Daily records) සහ චාරිකා චිට් (Trip Chit) තබා ගැනීම යනාදී කටයුතු වතුඅධිකාරීවරයාගේ අධීක්ෂණය යටතේ සිදු කෙරේ.

**අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද**

08 ශ්‍රේණිය සමත් විය යුතු අතර, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රය (බර වාහන පැදවීමට) ලබාගෙන තිබිය යුතු අතර, බර වාහන රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රජයේ ආයතනයක හෝ පිලිගත් පෞද්ගලික අංශයේ ආයතනයක රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර හතරක (04) පළපුරුද්දක් අත්‍යාවශ්‍යවේ.

**වැටුප** : වතු කාර්ය මණ්ඩල සාමූහික ගිවිසුමට අනුව සාකච්ඡා කළ හැක

**වයස් සීමාව** : අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (තේ පර්යේෂණ ආයතනයේ වතුයායන්වල සේවයේ යෙදී සිටින අය සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ).

මෙම තනතුරු ස්ථිර තනතුරු වේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් සේවා අවශ්‍යතා අනුව රත්නපුර ශාන්ත ජෝකිම් වත්ත හෝ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය විසින් කළමනාකරණය කරනු ලබන වෙනත් වතු යායන් හි සේවය කිරීම අවශ්‍ය වේ.

සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාවක් (CV) සහිත අයදුම්පතක් සමග උප්පැන්න සහතිකයේ පිටපතක් අදාළ අධ්‍යාපනික සහ අනෙකුත් වෘත්තීය සුදුසුකම්වල පිටපත් සහ සේවා සහතිකවල පිටපත් සහ අයදුම්කරුගේ කුසලතා තක්සේරු කළ හැකි අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධයක් ඇති ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග 2025 දෙසැම්බර් 01 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත අත්සන් කරන අය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

රාජ්‍ය සේවයේ/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලහි සේවය කරනු ලබන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතුය. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවීම අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට හේතු වේ.

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කූම්බ්ස්, තලවාකැලේ.**